**දේශපාලන විද්‍යාව - ඒකක පරීක්ෂණය - 2020 අප්‍රේල් - අංක 06**
**පළාත් අධ්‍යාපන දේපාර්තමේන්තුව - මහනුවර - කාලය පැය 01**

## A- කොටස

*01).* පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයන්ට අදාළ නොවන්නේ,

1.. පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂවල ශක්තිය මත ආණ්ඩුව පිහිටවයි.

2. ආණ්ඩුව පාර්ලිමේන්තුවේ විශ්වාසය මත රදාපවතින බැවින්, පාර්ලිමේන්තුවට වගකීමට ආණ්ඩුව බැදී තිබීම.

3.විධායකයේ සාමාජිකයන් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ බහුතර ආසන සංඛ්‍යාවක් හිමි පක්ෂයේ සාමාජිකයන් අතුරින් පත්කිරීම.

4.විධායකය සාමූහිතව එකක් වීම.

5.ආණ්ඩුවේ නායකයාවන අගමැති රාජ්‍ය නායකධූරය හා ප්‍රධාන අණදෙන නිලධාරී තනතුර දැරීම.

*02).* ජනාධිපති ආණ්ඩුක්‍රමයේ මූලධර්මයක් නොවන්නේ,

1..විධායකය සහ ව්‍යවස්ථාදායකය එකිනෙකට වෙනස් මැතිවරණ 2කින් තෝරාපත් කරගැනීම.

2.ව්‍යවස්ථාව මගින් එකිනෙකින් ස්වාධීන වු බල කේන්ද්‍ර දෙකක් විධායකයට සහ ව්‍යවස්ථාදා-යකයට පවරා තිබීම.

3.විධායකයේ බලය ජනාධිපතිවරයා අත එකරාශි කිරීම.

4.රාජ්‍ය නායකයා හා ආණ්ඩුවේ නායකයා යන තනතුරු දෙකම ජනාධිපති නිලයවටා කේන්ද්‍ර කර ගැනිම.

5. විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින්, ජනාධිපති ධූරයෙන් ඉවත් කිරීමට ව්‍යවස්ථා දායකයට හැකිවීම

*03).* අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණවලට අදාල නොවන්නේ,

1.කැබිනට් හා ජනාධිපති ආණ්ඩුක්‍රමවල මූලික මූලධර්ම එකට එක්කෙට සකස් කර ඇත.

2.කැබිනට් මණ්ඩලය හා ජනාධිපති සහිත ද්විත්ව විධායකයෙන් යුක්ත වීම.

3.ක්‍රියාත්මක වන්නේ ජනාධිපතිවරයාගේ නායකත්වය යටතේය.

4.එක් පක්ෂ ආධිපත්‍යයක් සහිත දේශපාලන ක්‍රම සදහා වඩාත් යෝග්‍ය ආණ්ඩුබවට පොදුවේ පිළිගනි.

5.විධායක බලතල සහිත අගමැතිවරයා සහ ඇමති මණ්ඩලයක් ජනාධිපතිවරයා අභිමුඛව සිටීම නිසා ඔවුන් පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්ත ඇතිතාක් ධූරය දැරීම.

*04)*. ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමයට නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1..ස්වැයංව පත් වු පාලකයෙකු විසින් රාජ්‍ය බලය ක්‍රියාවට නැන්වීම.

2.රාජ්‍ය බලය කේන්ද්‍රගත වීම හා බාහිර නෛතික අවරෝධක මගින් පාලකයා හැසිරවිය නොහැකිවීම.

3.කතිපයාධිකාරී ප්‍රභූන් විසින් රාජ්‍ය බලය ක්‍රියාවට නන්වන ආණ්ඩුක්‍රමයක් වේ.

4.නිශ්චත දේපාලන හා ආර්ථික දැක්මකින් යුතුව පාලනය කරන ආණ්ඩුක්‍රමයක් වේ.

5.ආණ්ඩුකරණය හා සම්බන්ධ කිසිදු කරුණක් පිළිබදව ජනතාවට හඬක් නොනැගිය හැකි ආණ්ඩුක්‍රමයක් වේ.

*05)*. සන්ධීය ආණ්ඩුක්‍රමයක අයහපත් ලක්ෂණයක් නොවන ප්‍රකාශය තෝරන්න.

1..විශාල රාජ්‍යයන් සංවිධානය කිරීම සදහා ස්වාභාවික හා ප්‍රයෝගික සැලැස්මක් සන්ධීය ක්‍රමය මගින් ලබාදේ.

2.භින්න වු සමාජයකට සුදුසු වේ.

3.මධ්‍යම ආණ්ඩුවට හා ප්‍රාන්ත ආණ්ඩුවලට සමාන බලයක් ලැබීම නිසා සමානාත්මතාවය ආරක්ෂා වීම.

4. ආණ්ඩුබලය විමධ්‍යගතවීම නිසා පුද්ගල නිදහස ආරක්ෂාවීම.

5.දෙවන මණ්ඩලය ප්‍රාන්ත නියෝජනය කරන නිසා සාර්ථක පාලන ක්‍රමයකට හේතුවීම.

B - කොටස

06).සන්ධීය ආණ්ඩුක්‍රම ගොඩනැගීමේ මාර්ග තුනකි. ඉන් දෙකක් ලියන්න .

1. ------------------------------------ 2. ---------------------------------------

07) .ඉන්දිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හදිසි අවස්ථා බලතල දෙකක් ලියන්න .

1. ------------------------------------ 2. ---------------------------------------

08).මිශ්‍ර ආණ්ඩුක්‍රමයක ලක්ෂණ දෙකක් ලියන්න .

1. ------------------------------------ 2. ---------------------------------------

09) .විධායක බලය පදනම් කරගත් ආණ්ඩුක්‍රම වර්ගීකරණය කොටස් දෙකකි. එය නම් කරන්න.

1. ------------------------------------ 2. ---------------------------------------

10).සන්ධීය ආණ්ඩුක්‍රමයක ස්වාධිපති බලය බෙදාහරින ආකාර දෙකක් ලියන්න .

1. ------------------------------------ 2. ---------------------------------------

ii. කොටස

01).සන්ධීය ආණ්ඩුක්‍රමය අර්ථ කථනය කර , එය පිහිටුවීමට මුල් වු හේතු හා එහි වාසි අවාසි විස්තර කරන්න . ( ල. 20)

02). ඒකීය ආණ්ඩුක්‍රම හා සන්ධීය ආණ්ඩුක්‍රමවල ලක්ෂණ සංසන්දනය කරන්න. ( ල. 20)